# වර්තමාන නීතිය තුළ බල පවත්නා රජරට රාජධානි සමය තුළ පැවති මානව අයිතිවාසිකම් සංකල්පය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් (හෝපිටිගමු ටැම් ලිපිය ආශ්‍රයෙන්)

ආර්.එම්.එස්. සෙව්වන්දි

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
sashikasew1998@gmail.com

**මුඛ්‍ය පද -** මානව අයිතිවාසිකම්, වත්මන් මානව අයිතිවාසිකම්, හෝපිටිගමු ටැම් ලිපිය

**හැඳින්වීම**

මහියංගනය සිට කි.මී. පහක් පමණ ඊසානෙන් වන සොරබොර වැව අසල පිහිටි, ක්‍රි.ව. 1857 දී ජෝන් බෙලි විසින් සොයා ගන්නා ලද හෝපිටිගමු ටැම් ලිපිය, අනුරාධපුර පාලක iv වන උදය (ක්‍රි.ව. 935-938) රජුගේ කාලයට අයත් වන ශිලා ලේඛනයකි. බදුලු ටැම් ලිපිය ලෙස ද හඳුන්වන මෙය වර්තමානය වන විට ලාංකේය පුරාවිද්‍යාඥයන් අනාවරණය කරන පරිදි ප්‍රමාණයෙන් විශාලතම ශිලා ලේඛනය මෙන් ම කුඩාම අක්ෂරයෙන් යුතු ලේඛනය ලෙස ද පිළිගැනේ. හෝපිටිගම නම් වෙළඳ ගමේ ක්‍රමික පාලනය උදෙසා සැකසූ ව්‍යවස්ථාව ලෙසට හඳුනාගත හැකි මෙම සෙල්ලිපිය තුළ සඳහන් වන කරුණු මගින් වෙළෙඳපොළ පරිපාලනය පිළිබඳ තොරතුරුවලට අමතරව වර්තමානය තුළ ද බල පවත්නා මානව අයිතිවාසිකම් සංකල්පයේ මූල බීජ පිළිබඳව හඳුනාගත හැකි ය. මනුෂ්‍යයෙකු වශයෙන් ලොව උපදින සෑම පුද්ගලයෙකුටම හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ලෙසට සැලකෙන අතර ලොව නීතියක් ලෙසට මානව අයිතිවාසිකම් සංකල්පය ක්‍රියාත්මක වීමට ශතවර්ෂ ගණනාවකට පෙර සිටම ලංකාව තුළ නීතියක් මෙන්ම නීතියක් නොවන ලෙසටත් මානව අයිතිවාසිකම් ක්‍රියාත්මකව පැවති බව පැහැදිලි කරුණකි. ඒ බව බොහෝ සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් ද සනාථ වේ. තවත් ලෙසකින් කිවහොත් මිනිසාට තම සමාජ ජීවිතය යහපත්ව පවත්වාගෙන යෑමට අවශ්‍ය කොන්දේසි අයිතිවාසිකම් ලෙසට සරලව අර්ථකථනය කළ හැක. අතීතයේ පටන් අද දක්වාම මිනිසා සතු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැළසීම පාලක පන්තිය සතු වගකීමක් වන අතර හෝපිටිගම ටැම් ලිපිය තුළින් හෙළිවන වර්තමානයේ නීතියක් ලෙස ද බල පැවැත්වෙන රජරට ශිෂ්ටාචාරයේ ක්‍රියාත්මක වී ඇති මානව අයිතිවාසිකම් සංකල්පය කෙබඳු ද? යන පර්යේෂණ ගැටලුව පාදක කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ලිපියේ එන වෙළෙඳපොළ පරිපාලන නීති පිළිබඳ බොහෝ අධ්‍යයනයන් සිදු කෙරුණ ද යටි පෙළින් වන මානව අයිතිවාසිකම් පිළිබඳ පර්යේෂණ විරල අතර එකී හිඩැස ආවරණය කිරීම සහ බදුලු ටැම් ලිපියේ එන වර්තමානය තුළ ද බල පවත්නා මානව අයිතිවාසිකම් පිළිබඳව හඳුනාගැනීමේ මුඛ්‍ය පරමාර්ථය සහිතව සිදුකරන ලද මෙම පර්යේෂණයෙන් වර්තමාන මානව අයිතිවාසිකම් සංකල්පයට මූල බීජ සපයන මෙරට ඉපැරැණි සමාජයේ පැවති අයිතිවාසිකම් පිළිබඳ නීතිරීති හඳුනා ගැනීමට හැකිවීම වැදගත් ය. එමෙන්ම මානව අයිතිවාසිකම් පිළිබඳ අඩු දැනුමක් සහිත සමාජයක මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුම සමාජගත කිරීමට හැකි වීම ද මෙම අධ්‍යයනයේ වැදගත්කමකි.

**ක්‍රමවේදය**

හෝපිටිගම ටැම් ලිපිය තුළින් හෙළිවන වර්තමානයේ නීතියක්ව බල පැවැත්වෙන රජරට රාජධානි සමයේ පටන් මෙරට පැවති මානව අයිතිවාසිකම් සංකල්පය පිළිබඳව සිදු කරන ලද මෙම අධ්‍යයනය සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනයෙන් රැස් කරගන්නා ලද ගුණාත්මක දත්ත හා ප්‍රමාණාත්මක විශ්ලේෂණය කර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය මගින් සිදු කෙරිණි.

**ප්‍රතිඵල සාකච්ඡාව**

සමස්ත මානවයාගේ අභිවෘද්ධිය මත පදනම් සමාජයක යුතුකම්වලින් බැඳී පවතින ප්‍රධාන සංකල්පයක් ලෙස හඳුනාගත හැකි මානව අයිතිවාසිකම් සංකල්පය පිළිබඳව සමාජය තුළ කතාබහට ලක්වනුයේ දෙවන ලෝක යුධ සමයෙන් පසු කාලය තුළ වන නමුත් ශ්‍රී ලංකාව තුළ ඊට ශතවර්ෂ ගණනාවකට පෙර සිට මෙම සංකල්පය නීතියක් ලෙසටම ක්‍රියාත්මකව පැවති ආකාරය මූලාශ්‍රයගත තොරතුරුවලින් පැහැදිලි වේ. බදුලු ටැම් ලිපියේ වෙළෙඳපොළ පරිපාලන නීතිරීති පිළිබඳ ප්‍රධාන වශයෙන් සඳහන් වුව ද එය සූක්ෂමව අධ්‍යයනය කිරීමෙන් වර්තමානයේ සම්මත නීතියක් ලෙසට බලපවත්නා මානව අයිතිවාසිකම් සංකල්පයේ මූල බීජ පිළිබඳව හඳුනාගත හැකි ය. රජරට රාජධානි සමයේ සාමාන්‍ය පුරවැසියෙකු ලෙස නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය පිළිබඳව මෙන්ම යුක්තිය පසිඳලීමේ දී අධිකරණමය වශයෙන් සාමාන්‍ය ජනයා පවා ලබා ඇති අයිතිවාසිකම් පිළිබඳව මෙම පර්යේෂණය මඟින් හඳුනාගත හැකි විය. ඕනෑම සමාජයක් තුළ යුක්තිය හා සමාය පවත්වාගෙන යාම සඳහා පිළිගත් නීතිරීති සමුදායක් අත්‍යවශ්‍ය වේ. සමාජයක් විසින් අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු නීතිරීති පද්ධතියක් වර්තමානයේ මෙන්ම ඉපැරණි ශ්‍රී ලාංකේය රාජාණ්ඩු ක්‍රමය තුළ ද පැවත ඇති බව මෙයින් පැහැදිලි ය. විශේෂයෙන්ම මනුෂ්‍යයෙකු ලෙස වධ හිංසාවලින් මිදීමේ අයිතිය මෙන්ම වරදකරුවන්ට දඬුවම් කිරීමේ දී එය ක්‍රමවත් ක්‍රියා පටිපාටියකට සිදු කිරීම අතීතයේ පටන්ම මෙරට තුළ ක්‍රියාත්මක බව ලිපියේ එන කරුණුවලින් සනාථ වන අතර එය වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12 වගන්ති මඟින් තහවුරු කර ඇත. ගම්ලත් නිලධාරියා නීතිය උල්ලංඝනය කරන්නේ නම් රදොළට පැමිණිලි කිරීමට ලබාදී තිබූ අයිතිය තුළින් අධිකරණමය වශයෙන් ලැබී තිබුණු නිදහස තහවුරු වේ. එය වර්තමානය තුළ අධිකරණ තීන්දුවක දී අභියාචනා ඉදිරිපත් කිරීම ආදී විසඳුම්වලට යොමුවීමට ඇති අයිතියට සමාන ය. සර්ව සාධාරණ පරිපාලනයකට යටත්ව කටයුතු කිරීමට මෙන්ම සාධාරණය ඉක්මවා අසාධාරණය ඉස්මතු වන අවස්ථාවල විරුද්ධ වීමට ද නිදහස ජනතාව භුක්ති විඳි බව ඉහත සඳහන තුළින් ම පැහැදිලි කරගත හැකි කරුණකි. වෙළෙඳපොළ තුළ වෙළෙන්දෙකු වශයෙන් මෙන් ම පාරිභෝගිකයෙකු වශයෙන් නිදහස්ව කටයුතු කිරීමට අයිතියක් ඕනෑම පුද්ගලයකු සතු වන අතර ඒ බව අභ්‍යන්තර වෙළඳපොළ පරිපාලනය පිළිබඳ සඳහන් තොරතුරු මඟින් පැහැදිලි විය. එමෙන්ම සෞඛ්‍ය අයිතිය ජනතාවට තහවුරු කරදීමට අතීතයේ සිටම මෙරට පාලකයන් කටයුතු කර ඇති බව පැහැදිලි කරුණකි. "බුලත් පුවක් මණ්ඩපයක තබා විකිණීමට" ලිපිය තුළින් පනවා තිබෙන නීතිය මඟින් එය තහවුරු වේ. වර්තමානයේ මෙකී සංකල්පය ශ්‍රී ලංකා ආණ්ඩුකම ව්‍යවස්ථාවේ අයිතිවාසිකමක් බවට පත්කර නොතිබුණ ද ජනතාවගේ සෞඛ්‍යය නඟා සිටුවීම සඳහා රාජ්‍ය අංශයෙන් විශාල මැදිහත්වීමක් දැකිය හැක.

මානව අයිතිවාසිකම් සංකල්පය රජරට ශිෂ්ටාචාර සමයේ පටන්ම ක්‍රියාත්මක සංකල්පයක් බවත්, වර්තමාන ශ්‍රී ලංකාව මෙන්ම ලෝකය තුළ ද අයිතිවාසිකමක් ලෙස පිළිගෙන පවතින සංකල්ප රජ දවස ද නීතියක් මෙන්ම නීතියක් බවට පත් නොකර ද ක්‍රියාත්මක කළ අවස්ථාවන් රැසක් පැවති බව මෙකී අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

කරුණාරත්න, ඒ.එම්. (2012), ***වංසකතාවල නොකියවෙන ශිලාලිපිවලින් හෙළිවන ලංකා ඉතිහාසය***, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

ගමගේ, ඩී.පී., (2009), ***ශ්‍රී ලංකාවේ ශිලාලේඛනවලින් හෙළිවන මානව අයිතිවාසිකම්,*** කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

අමරවංශ හිමි, කොත්මලේ. (1969), ***ලක්දිව සෙල්ලිපි***, කොළඹ: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම